www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හින්දු දක්ෂිනාංශය විසින් ලුහුබැඳි සුප්‍රසිද්ධ ඉන්දීය චිත්‍ර ශිල්පියා කටාර් පුරවැසි භාවය ලබාගනී

## Hounded by Hindu right, India's best-known painter takes Qatari citizenship

**පානිනී විජේසිරිවර්ධන හා**
**පාවිනී සෝරා විසිනි**
**2010 මාර්තු 13**

හින්දු මූලධර්මවාදීන් සහ අධිපතිවාදීන් විසින් තමන්ව ලුහුබැඳීමේදී සහ ගොදුරු කර ගැනීමේ දී ඉන්දියානු රාජ්‍යය සහ දේශපාලන ප්‍රභූවේ අපරාධයන්ට එරෙහි හද සසල කරවන විරුද්ධත්වයක් පලකරමින් ඉන්දියාවේ වඩාත් ම ප්‍රකට සහ වඩාත් ම සම්භාවනාවට පාත්‍ර දෘෂ්‍ය කලා ශිල්පියා වන මක්බූල් ෆිඩා (එම්. එෆ්.) හුසේන් පසුගිය මාසයේ කටාර්හි පුරවැසි භාවය පිලිගත්තේ ය.

දැනට 94 වන වියේ පසුවන හුසේන් පසුගිය දශක හත පුරා චිත්‍ර ශිල්පියෙකු ලෙස කටයුතු කොට ඇත. තව ද ඔහු ඡායාරූප ශිල්පියෙක් සහ චිත්‍රපට කරුවෙක් ද වේ. ඉන්දියාව තුල ද ඉන් පිටත ද ඔහුගේ චිත්‍ර ඉමහත් ගෞරවයට පාත්‍ර වී ඇත.

නග්න හින්දු දෙවි දේවතාවන් නිරූපනය කරමින් හුසේන් 1970 ගනන්වල අඳින ලද චිත්‍ර අරබයා හින්දි භාෂාවෙන් පලවන සඟරාවක් කෑ මොරගැසීම ආරම්භ කල 1996 පටන් ඔහු සහ ඔහුගේ චිත්‍ර නිරන්තර ප්‍රචන්ඩ ප්‍රහාරවල ඉලක්කය බවට පත්ව ඇත. අනාගමික යයි කියන කොංග්‍රස් පක්ෂය මෙන් ම හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) සහ ෂිව්සේනා යන පක්ෂ ඇතුලත් දේශපාලන සංස්ථාපිතයේ ද අධිකරනයේ ද බොහෝ අංශවල සහයෝගය ලබමින් කිසිදා අවසන් නො වන නෛතික දඩයමක විෂය බවට ද ඔහු පත්ව ඇත.

මුස්ලිම් ජාතිකයින්ට පහර දීමේ දී හින්දු දක්ෂිනාංශය සිය වාර්ගික සහ ආගම්වාදී උද්ඝෝෂන කිසිදු අයුරකින් ලඝු නො කරන අතර හුසේන් උපතින් මුස්ලිම් වීමත් තමන් අනාගමික සහ සම්මිශ්‍රිත ඉන්දියානු සංස්කෘතියේ ප්‍රමුඛයෙක් බව ඔහු ම ප්‍රකාශ කොට තිබීමත් ඔවුන් ඔහුව ඉලක්ක කර ගැනීමට අනිවාර්ය හේතුවක් වේ.

කායික ප්‍රහාර සහ නෛතික චෝදනා පිලිබඳ බියෙන් 2006 දී හුසේන් ඉන්දියාව හැර ගියේ ය. එතැන් පටන් ඩුබායි හි ජීවත් වී ඇති ඔහු ලන්ඩන් හි ගිම්හානයන් ගතකලේ ය.

මාධ්‍ය වාර්තාවලට අනුව ඔහු කටාර් පුරවැසි භාවය ඉල්ලා නො සිටියත් ගල්ෆ් රාජ්‍යයේ පාලක පවුල විසින් එය ඔහුට ප්‍රදානය කලවිට පිලිගත්තේ ය.

ඉන්දියාව ද්විත්ව පුරවැසි භාවයට අවසර නො දෙන බැවින් ඔහු කටාර් ප්‍රදානය පිලිගැනීම ඉන්දියානු පුරවැසි භාවය නිෂ්ක්‍රමනය කිරීමක් වේ. මාර්තු මෙම චිත්‍ර ශිල්පියා සිය ඉන්දියානු ගමන් බලපත්‍රය භාරදීම සඳහා කටාර්හි ඉන්දියානු තානාපතිවරයා මුනගැසුනි.

*ගල්ෆ් මධ්‍යාමම්* නමැති මලයාලම් භාෂාවෙන් පලවන පුවත් පතේ ඩෝහා සංස්කරනය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී හුසේන් සිය "මව්බිම" කෙරෙහි ඇති "ආදරය" පලකල ඔහු ඉන්දියාව තමන්ව "ප්‍රතික්ෂේප කොට" ඇතැයි කීවේ ය.

"හින්දු අධිපතිවාදී සංග් පරිවාර් කල්ලි මාව ඉලක්ක කර ගත්විට සියල්ලෝ ම නිශ්ශබ්දව සිටියා. දේශපාලන නායකත්වය, කලාකරුවෝ හෝ බුද්ධිමත්තු ඇතුලු කිසිවෙක් මා වෙනුවෙන් කතාකිරීමට ඉදිරියට ආවේ නැහැ."

ඉන්දියානුවන් අතිමහත් බහුතරයක් තමන්ට සහාය දක්වන බව තමන්ට විශ්වාස යයි හුසේන් කීවේ ය. "සමහර දේශපාලනඥයින් ද ඇතුලත් ව මට විරුද්ධ වන්නේ සියයට 10ක් පමනයි."

"ඉන්දියාවේ කිසිම ආන්ඩුවකට මාව ආරක්ෂා කිරීමට බැරිවුනා. ඒ නිසා එවැනි රටක ජීවත් වීමට මට අමාරුයි. දේශපාලනඥයින් උනන්දු වන්නේ ඡන්ද ගැන පමනයි."

"දැන් ඔවුන් මට ආපසු එන්න යයි කියනවා.... මාව ආරක්ෂා කිරීම ප්‍රතික්ෂේප කල දේශපාලන නායකත්වයක් ගැන මම විශ්වාස කරන්නේ කොහොමද? ඉන්දියාවේ දී මට ආරක්ෂාව ලැබේවි යයි කිසිදු විශ්වාසයක් තිබෙනවා ද?" යනුවෙන් ද ඔහු ඇසී ය.

තමන්ට එරෙහි උද්ඝෝෂනය "කලාවට සහ කලාකරුවෙක් ස්වයං-ප්‍රකාශනයට එරෙහි ව්‍යාපාරයක්" ලෙස හුසේන් හැඳින්වී ය.

තමන් "කිසිවිටෙක කලාව හරහා කිසිවෙකුගේ මනෝගතීන්ට හානි කිරීමට අදහස් නො කල" බව ඔහු කීවේ ය. "මම හුදෙක් කලාව හරහා මගේ ආත්මයේ නිර්මානශීලිත්වය ප්‍රකාශ කලා පමනයි. කලාවේ භාෂාව වන්නේ විශ්ව භාෂාවයි. මගේ ශක්තිය වන්නේ සියලු පටු දෘෂ්ටීන් ඉක්මවා එයට ආදරය කරන ජනතාවයි."

හුසේන්ගේ අදහස් වනාහි ඉන්දීය රාජ්‍යය සහ එහි ප්‍රභූව පිලිබඳව කෙරෙන හෘදයාංගම සහ මුලුමනින් ම සාධාරන හෙලා දැකීමකි.

බොහෝ කාලයක් පුරා ඉන්දියාව තුල හින්දු දක්ෂිනාංශය පැවතියේ ගනන් නොගත හැකි ඉතා පටු බලයක් ලෙසිනි. එහෙත් මෑත දශකවල ඉන්දියානු ධනේශ්වරය, සමාජ අසමානතාව සහ ආර්ථික අනාරක්ෂිත භාවය වැඩි දියුනු කොට ඇති කම්කරු පන්තික විරෝධී "වෙලඳපොල ප්‍රතිසංස්කරනවලට" හැරීමත් සමග සමපාතව සියලු වර්ගවල වාර්ගික සහ කුලවාදී දේශපාලනයට දිරි දී තිබේ.

1992 දී බබ්රි මස්ජිඩ් මුස්ලිම් පල්ලිය බිමට සමතලා කිරීම සහ 2002 ගුජරාට් සංහාරය වැනි වාර්ගික සංහාරයන් සිදු කිරීමටත් චිත්‍ර ශිල්පී හුසේන් ඉලක්ක කර ගැනීම වැනි තුච්ඡ ප්‍රජාතන්ත්‍ර විරෝධී උද්ඝෝෂන විපාක විඳීමකින් තොරව දියත් කිරීමටත් ඉන්දීය නෛතික දේශපාලනික ආයතන විසින් හින්දු අධිපතිවාදීන්ට අවසර ලබා දී ඇත. දැනට ඉන්දීය පාර්ලිමේන්තුවේ නිල විපාර්ශ්වය වන බීජේපීය 1996 සිට 2004 දක්වා රට පාලනය කල ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සංධානයේ (එන්ඩීඒ) ප්‍රමුඛ පාර්ශවකරුවා විය.

මධ්‍ය ප්‍රදේශ්හි පලවන 'විචාර් මීමන්සා' නම් මාසික සඟරාවක් 1996 සැප්තැම්බරයේ දී "එම්. එෆ්. හුසේන්ඃ චිත්‍ර ශිල්පියෙක් ද මස්කඩ කරුවෙක් ද" යන හිසින් ප්‍රකට හෙලිදරව්වක් පලකලේ ය. කලාවට සහ ඥානයට අධිපති හින්දු දෙවඟන වන සරස්වතී නිරූපනය කරමින් හුසේන් අඳින ලද 25 වියැති චිත්‍රයක් ලිපිය විසින් හෙලා දක්නා ලද්දේ ඔහු ඇයව නිරුවත්ව නිරූපනය කිරීම කෝපය දනවන බැව් කියමිනි. (ඇත්ත වසයෙන් ම ස්ත්‍රී රූපය කංචුක හැඩතල වලට පමනක් සීමාවිය.)

ඒ සමග ම හුසේන්ගේ චිත්‍ර ආගමික සතුරුභාවය දිරිගන්වන බවත් ආගමික මනෝගතීන් සහ විශ්වාසයන්ට නිගරු කරන බවත් යන පදනම මත යාබද මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ "සංස්කෘතික ඇමති" සහ ෂිව් සේනා නායක ප්‍රමෝද් නවල්කාර්, හුසේන්ට එරෙහි අපරාධ චෝදනා නැගීම ඇරඹීය. චෝදනා නැගීමෙන් දින තුනකට පසුව (ලෝක හින්දු සභාව හෙවත් වීඑච්පීහි තරුන අංශය වන) බජ්රන්ග් ඩාල් සංවිධානය විසින් මෙහෙයවන ලද තරුන ජනයා අහමදාබාද්හි කලාගාරයකට කඩා වැදී හින්දු මිථ්‍යාමය පුරාවෘතවල වානර දෙවියා ලෙස හඳුන්වන හනුමන්තා සහ ජනප්‍රිය බොලිවුඩ් නිලියක් වන මධුරි ඩික්සිත් නිරූපනය කරන චිත්‍ර මාලාවක් ඇතුලුව හුසේන්ගේ ගෙත්තම් 23ක් සහ චිත්‍ර 28ක් විනාශ කලහ.

ඉන් වසර දෙකකට පසුව 1998 දී බොම්බායේ හුසේන්ගේ නිවසට කඩාවැදී හානි පමුනුවන ලද්දේ රාමායනය නමැති ඉන්දීය වීරකාව්‍යයේ චරිත වන හනුමන්තා සහ සීතාගේ චිත්‍ර "ආගමික විශ්වාසයන්ට නිගරු වන" ලෙස ඉදිරිපත් කොට ඇතැයි කියාපාමිනි.

ඉන්දියාවේ සහ පකිස්තානයේ කාශ්මීර කලාපයේ 2005 ඔක්තෝබරයේ ඇති වූ භූමි කම්පාවෙන් විපතට පත්වූවන් වෙනුවෙන් අරමුදල් රැස්කරන මිෂන් කාශ්මීර් නමැති සංවිධානය වෙනුවෙන් හුසේන් නිර්මානය කරන ලද "මදර් ඉන්දියා (ඉන්දු මාතා)" නමැති චිත්‍රයට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස බල කරමින් 2006 දී හින්දු දක්ෂිනාංශය විසින් වීදි විරෝධතා දක්වන ලදී.

එම චිත්‍රය ඉන්දියාවේ සිතියමට මනාව සංයෝග කරන ලද නිරුවත් කාන්තාවක් නිරූපනය කලේ ය. ෂිව් සේනා නායක බග්වන් ගොයෙල් ප්‍රසිද්ධියේ කියා සිටියේ හුසේන්ගේ එක් අතක් කපා දමන පුද්ගලයෙකුට රුපියල් මිලියන බාගයක තිලිනයක් දෙන බවයි.

එම වසරේ ම මැයි 22 දා හුසේන්ගේ නිර්මාන ප්‍රදර්ශනයක් ඇරඹී කිහිප දිනකට පසුව, දුර්ගා සහ ද්‍රව්පදී යන හින්දු දෙවඟනන් දෙදෙනා නිරූපනය කරන ඔහුගේ චිත්‍ර දෙකක් හින්දු මූලධර්මවාදීන් විසින් විරූපී කිරීම හේතුවෙන් ප්‍රදර්ශනය නවතා දැමීමට ලන්ඩනයේ ඒෂියා හවුස් ගැලරි කලාගාරය තීරනය කලේ ය. වීඑච්පී සහ රාෂ්ට්‍රීය ස්වයම්සේවක් සංග් (ආර්එස්එස්) සමග සංවිධානය වූ බ්‍රිතාන්‍යයේ පදනම් වන හින්දු මූලධර්මවාදියෝ ප්‍රදර්ශනය වසා දමන ලෙස උද්ඝෝෂනයේ යෙදෙමින් සිටියහ.

ප්‍රදර්ශනයට පෙර ප්‍රසිද්ධ කල අදහස් දැක්වීමක දී තමන්ගේ නිර්මාන ඉන්දීය සාම්ප්‍රදායික කලාව කලාත්මක ප්‍රකාශනයේ අද්‍යතන මාදිලීන් සමග සංයෝගී කිරීමට උත්සාහ දරා ඇත්තේ කෙසේදැයි හුසේන් විස්තර කලේ ය. "පසුගිය 50 වසර පුරා ඉන්දීය චිත්‍ර ශිල්පීන්ගේ බුද්ධිමය එකතුවක් විසින් පුරාන සංස්කෘතික උරුමයේ යථාර්ථය අපගේ යුගය සමග යලි සම්බන්ධ කිරීමේ නිරතව සිට ඇත. සෑම මානව ප්‍රයත්නයක දී මෙන් ම සමස්තයේ අරටුවේ තිබෙන්නේ විශ්වාසය යි. සියලු විශ්වාසයන් පිලිබඳව සෑහෙන අවධානයක් සහ ගෞරවයක් සමගින් ඉන්දු උප-මහාද්වීපය අද්විතීය අනාගමික සංස්කෘතියක් බවට පරිනාමය වී ඇත. මම ශ්‍රේෂ්ට ඉන්දීය සම්මිශ්‍රිත සංසකෘතියක් නිර්මානය කිරීම අරබයා නිහතමානීව දායක වන්නෙක් වෙමි."

හුසේන්ගේ ගබ්සා කරන ලද ලන්ඩන් ප්‍රදර්ශනය විවෘත කිරීමට දින කිහිපයකට ප්‍රථමයෙන් ඉන්දීය කොංග්‍රස් පක්ෂය නායකත්වය දෙන එක්සත් ප්‍රගතිශීලී සංධාන (යූපීඒ) ආන්ඩුවේ ස්වදේශ ඇමතිවරයා හුසේන්ගේ කෘති "ආගමික හැඟීම්වලට හානි කිරීමේ" විභවය සහිත නිසා ඔහුට එරෙහිව "සුදුසු" පියවර ගන්නා ලෙස මුම්බායි සහ දිල්ලි පොලීසිවලට නියෝග නිකුත් කලේ ය.

අනාගමිකත්වයේ ශූරයෙකු ලෙස පෙනී සිටින්නාවූ කොංග්‍රස් පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන හා ස්ටැලින්වාදී පාර්ලිමේන්තු පක්ෂ දෙක සහ ඔවුන්ගේ වාම පෙරමුන විසින් මුක්කුව දෙනු ලබන ආන්ඩුවක්, හින්දු දක්ෂිනාංශය විසින් දිරිගන්වන ලද තමාට එරෙහි උද්ඝෝෂනයට සහයෝගය දීම නිසැකව ම හුසේන්ට දැඩි පහරකි. ඉක්බිති, හුසේන්ගේ ම වචනවලට අනුව, ඔහු "ජාත්‍යන්තර අභිකුන්ඨකයෙක්" බවට පත් විය.

හුසේන්ට අනුව 2007 දී ඉන්දියාව තුල ඔහුට එරෙහිව අපරාධ නඩු 900කට වැඩි ගනනක් ඇසීමට තිබිනි. "මට නැවත නිවසට නො පැමිනෙන ලෙස උපදෙස් දීමට තරම් දේවල් නෛතිකව සංකීර්න ය."

මේ අවස්ථාව වනවිට හුසේන්ට හිතාමතා ම ආගමික හැඟීම්වලට හානි කිරීමේ චෝදනා ඉදිරිපත් කරන්නේ නම් චෝදකයන් සතුව "ශක්තිමත් හේතුවක්" තිබිය යුතු යයි තමන් නීර්නය කර ඇති බව යූපීඒය විසින් මෙහෙයවූ නීති අමාත්‍යාංශය ප්‍රකාශ කොට තිබුනු අතර වරෙන්තුවකට ප්‍රතිචාර දැක්වීමට අසමත් වීම නිසා පහල අධිකරනයක් ඔහුගේ දේපොල පවරාගැනීමට නියෝග කලේ ය.

අවසානයේ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරනය දේපොල පවරාගැනීම නතර කල අතර දීර්ඝ ක්‍රියාදාමයකින් පසු 2008 සැප්තැම්බරයේ හුසේන්ගේ චිත්‍ර අසභ්‍ය නො වන බව නිගමනය කලේ ය. මෙම නිගමනයේ දී පෞරානික පන්සල්වල බිත්ති ද ඇතුලත් හින්දු අනුප්‍රානීය කලාවන් නිරුවත් රූපවලින් පිරී ඇතැයි යන පැහැදිලි කරුනට උසාවිය අවධානය යොමු කලේ ය.

පුරවැසියෙක් සහ කලාකරුවෙක් ලෙස හුසේන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරනය කල් පමා වී ඉදිරිපත් වීම ඔහුව අසහනයට පත්කිරීමට නොකඩවා උසාවි භාවිතා කිරීමෙන් සහ ඔහුට සහ ඔහුගේ නිර්මානවලට එරෙහිව වෛරය අවුලුවාලීමෙන් ඔහුගේ විරුද්ධවාදීන්ව වලක්වා නැත. 2008 නොවැම්බරයේ මුම්බායි වෙත එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයට ප්‍රතිචාර ලෙස නිර්මානය කරන ලද "ඉන්දියාව දූෂනය කිරීම" නම් චිත්‍රයට එරෙහි හෙලා දැකීම් ද මෙයට අයත් වේ.

2004 වර්ෂයේ නිර්මානය කරන ලද මීනාක්ෂිඃ තෙනුවරක කතාවක් නමැති චිත්‍රපටය ද හුසේන්ගේ සමහර නිර්මාන මුස්ලිම් මූලධර්මවාදී කන්ඩායම්වල විරෝධයට විෂය වී ඇති බව සඳහන් කල යුතු ය.

ආන්ඩුවේ බලධාරීන්ගේ අනුදැනුම ද සහිතව හින්දු අධිපතිවාදී දක්ෂිනාංශය විසින් ඉලක්ක කරගන්නා එකම කලාකරුවා හුසේන් නො වේ. වඩාත් ප්‍රසිද්ධ සිද්ධි කිහිපයක් පමනක් සඳහන් කරතොත් 2000 වසරේ දී ඉන්දු-කැනේඩියානු චිත්‍රපට අධ්‍යක්ෂිකා දීපා මේතාට ඉන්දියාවේ වැන්දඹුවන්ගේ ඉරනම නිරූපනය කරන *වෝටර්* චිත්‍රපටය රූපගත කිරීම් නවතා දැමීමට බල කිරීම, එම වසරේ ම බීජේපී-නීත ජාතික ආන්ඩුව නවීන කලා ජාතික කලාගාරයේ පැවති ප්‍රදර්ශනයකින් සුරේන්ද්‍රන් නායර්ගේ චිත්‍රයක් ඉවත් කිරීමට නියෝග කිරීම, *ෆානා* චිත්‍රපටයේ ප්‍රධාන නලු අමීර් කාන් නර්මදා වේල්ල ඉදිකිරීම සඳහා ගෝත්‍රික ජනයා ඉවත් කිරීම විවේචනය කල නිසා එම චිත්‍රපටය ප්‍රදර්ශනය ගුජරාටිහි බීජේපී ප්‍රාන්ත ආන්ඩුව විසින් තහනම් කිරීම ආදිය දැක්විය හැක.

මෑත සති කිහිපයේ බොලිවුඩ් තරු ෂාරුක් කාන්ගේ නවතම චිත්‍රපටය වන *මයි නේම් ඊස් කාන්* ට එරෙහිව ප්‍රචන්ඩ තර්ජන ද ඇතුලත් විෂසෝර උද්ඝෝෂනයකට ෂිව් සේනා නායකත්වය දී තිබේ. උපතින් මුසුල්මානුවෙක් වන ෂාරුක් කාන් ෂිව් සේනාහි විරෝධයට ලක්වන්නේ උතුරු ඉන්දියානුවා මුම්බායි වෙත සංක්‍රමනය වීමට එරෙහි එහි ප්‍රතිගාමී උද්ඝෝෂනයට එරෙහිව අදහස් පලකල නිසා ය. එහෙත් චිත්‍රපටය නැරඹීමට විශාල ගනනින් රොක්වීම වැලැක්වීමට ෂිව් සේනා අසමත් වී ඇත.

කලාකරුවෙක් ලෙස තම සමාජ තත්වය නො තකා ඉන්දියානු පුරවැසි භාවය අත්හැරීමට හුසේන් ගත් තීරනය ඉන්දීය දේශපාලනඥයන් සහ මාධ්‍ය වෙතින් නො සෑහෙන අදහස් දැක්වීම් අවුලුවා තිබේ. නිසැකව ම හින්දු දක්ෂිනාංශය සතුටට පත් වන අතර තමන් සහ මූලික ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම ආරක්ෂා කිරීමට අසමත් වීය යන ඔහුගේ චෝදනාවට දේශපාලන ප්‍රභූවේ සෙස්සන්ට පිලිතුරු නැත.

කොංග්‍රස් දේශපාලනඥ සත්‍යව්‍රත් චතුර්වේදි හුසේන්ගේ ජාතිකත්ව මාරුව පිලිබඳ අදහස් දැක්වීම ප්‍රතික්ෂේප කලේ එය "ඔහුගේ පුද්ගලික තීරනයක්" යයි කියමිනි. හුසේන්ව "ඉන්දියාවේ සාඩම්බරය" ලෙස හැඳින්වූ විදේශ ලේකම් නිරූපමා රාඕ ඔහුට යලි පැමිනෙන ලෙස දිරිගැන්වූවා ය. හුසේන්ගේ තීරනය "වාර්ගික සුසංගතභාවය විශ්වාස කරන්නන් ලැබූ විශාල පරාජයක්" යයි කොංග්‍රස් පක්ෂ මහලේකම් දිග්විජේ සිං කියා සිටියත් ඔහුගේ ඉරනම සම්බන්ධයෙන් කොංග්‍රස් පක්ෂයේ වගකීම ප්‍රතික්ෂේප කලේ ය. "හුසේන්ගෙන් ආන්ඩුවට ගැටලුවක් නැහැ. තව ද කලාකරුවෙක්ගේ හදවත බිඳවැටුනු විට එය ප්‍රකෘති වීමට සෑහෙන කාලයක් ගත වෙනවා" යයි සිං කීවේ

ය.

චිත්‍ර ශිල්පියාට එරෙහි හින්දු දක්ෂිනාංශයේ උද්ඝෝෂනය යලි තහවුරු කරමින් සහ අනුමත කරමින් බීජේපී ප්‍රකාශිකා නජ්මා හෙප්තුල්ලා "ඔහු (හුසේන්) ඉතා දක්ෂ කලාකරුවෙක්. එහෙත් කලා කෘති ජනතාවගේ ආගමික මනෝගතීන් හානි නො කල යුතු යි" යයි කීවා ය.

චෙන්නායි හි පදනම් වන ද හින්දු දිනපතා පුවත්පතේ ප්‍රධාන කර්තෘ එන්. රාම් හුසේන් ඉන්දියානු පුරවැසි භාවය අත්හැරීම ඉන්දීය ප්‍රභූව ලජ්ජාවට පත් කරතියි පිළි ගත්තේ ය. "හුසේන් මහතාගේ නිර්මානාත්මක නිදහස සහ සිතේ සාමය ආරක්ෂා කිරීමේ දී කොංග්‍රස්-නීත ආන්ඩුව කටයුතු කොට ඇත්තේ පූර්ව බීජේපී-නීත ආන්ඩුවට වඩා යහපත් අයුරින් නො වේ."

හුසේන්ගේ පුද්ගලික හිතවතෙක් වන රාම් "නො ඉවසිලිවන්ත කලහකාරීන්ගෙන් හුසේන්ට එල්ලවූ පීඩනයන් සහ ත්‍රස්ත කිරීම් පිලිබඳ මූලික අත්දැකීම්" පිලිබඳව ලියයි. "ඔහුගේ තාවකාලික පිටුවහල් වීම් වලින් ප්‍රථම එක අවසන් කොට ආපසු පැමිනීමේ දී ඔහුව මම මුම්බායිහි දී පිලිගත්තා. එහිදී නැගී එන ඉන්දියාව තුල මෙම නිර්මානාත්මක සුධීමතාට මුහුන දීමට සිදුව තිබෙන්නේ කෙබඳු අනාරක්ෂිත භාවයකට සහ අවිනිශ්චිත භාවයකට ද යන්න මා දුටුවා."

ඉන්දීය ප්‍රභූ තන්ත්‍රය විසින් දිරිගන්වනු ලබන විෂඝෝර වාර්ගික පරිසරය කලාත්මක නිදහස සහ නිර්මානශීලීත්වය මඩිමින්, වෛරයේ සහ ප්‍රචන්ඩත්වයේ බීජ වපුරමින් සහ ඉන්දියානු ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත වඩ වඩාත් ප්‍රහාර සඳහා අවශ්‍ය වටපිටාවක් නිර්මානය කරමින් සිටී.

සියලුම රාජ්‍ය චෝදනා නැගීම්වලින් සහ වාර්ගික අඩන්තේට්ටම් සහ ප්‍රචන්ඩත්වයන්ගෙන් නිදහස්ව ඉන්දියාව තුල ජීවත් වීමට සහ නිර්මානකරනයේ යෙදීමට හුසේන්ට ඇති අයිතිය ආරක්ෂා කරන ලෙස *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ඉන්දියාවේ සහ ලොව පුරා කම්කරුවන්ගෙන් ඉල්ලා සිටී.

© www.wsws.org